# සිංහල නම්... ආර්. නානායක්කාර
**B.A (sin) SP.Hons**


## භාෂා හැකියාව – සාරාංශකරණය

*සෑම ජයග්‍රාහී ගමනාන්තයක ම ආරම්භය නම් නොනවත්වා සිහින දැකීමයි ...*

**වාක්‍යයක, අනු ඡේදයක, පරිච්ඡේදයක, ප්‍රබන්ධයක හෝ දේශනයක සාරය හෙවත් හරය පමණක් ගෙනහැර දැක්වීම නැතහොත් පිඬුකොට දැක්වීම *සාරාංශකරණය* නම් වේ.**

- උපදෙස් -

- සිහිබුද්ධියෙන් සහ අවධානයෙන් යුක්තව ඡේදය වරක් හොඳින් කියවන්න. මෙම කියවීමේ දී ඡේදයේ මුඛ්‍ය අදහස කුමක්දැයි අවබෝධ කර ගත යුතු ය.
- දෙවන වර කියවීමේ දී මුඛ්‍ය අදහසට අදාළ වන වචන, වාක්‍ය සහ වාක්‍යාංශ ආදියට යටින් ඉරි ගසා ඒවා ලකුණු කර ගන්න.
- තුන්වන කියවීමේදී මුඛ්‍ය අදහසට අදාළවන අනෙක් අදහස් ඇත්නම් ඒ සියල්ල ලකුණු කර ගන්න.
- ලකුණු කර ගත් වාක්‍ය ඛණ්ඩ පමණක් කියවන්න. පුනරුක්ති නිදර්ශනාදිය ඇත්නම් ඒ අනවශ්‍ය සියල්ල ඉවත් කරන්න.
- උපමා, අලංකාර, අතිශයෝක්ති, උදාහරණ, විස්තර හා අනවශ්‍ය විශේෂණ ආදී සියල්ල අත්හළ යුතු ය.
- වාක්‍ය එකිනෙක අතර ස්වාභාවික සම්බන්ධයක් ඇතිවන අයුරින් ඔබගේ අභිමතය පරිදි අදහස් ගළපා සාරාංශය ලියන්න.
- මුල් ඡේදයේ අදහස සාරාංශ කියවන්නාට නිසැකින්ම ප්‍රකට විය යුතු ය.
- ඔබ සම්පිණ්ඩනය කළ යුත්තේ වචන නොව වාක්‍යාංශ සහ වාක්‍ය ඛණ්ඩ පමණක් බව සැලකිල්ලට ගන්න.
- ප්‍රථම පුරුෂ හා අතීත කාලය යෙදිය හැකි සෑම තැනකම යොදන්න.
- සාමාන්‍යයෙන් සාරාංශයක් මුල් ඡේදයෙන් තුනෙන් එකක් පමණ විය යුතු ය.
- වාක්‍ය නිර්මාණය පිළිබඳ විවිධත්වයක් තිබිය යුතු ය.
- මුල් ඡේදයේ ඇති උපුටා ගැනීම්. දෙබස්, සංවාද, ආදියෙහි අදහස් පමණක් ගෙන සංක්ෂිප්තව ලිඛිත බසින් ලියන්න.
- වනාහි, වූ කලී නම් ආදී අනවශ්‍ය නිපාත ඉවත් කරන්න.
- ඡේද කිහිපයක් සාරාංශ කළ විට තනි ඡේදයක් ලෙස ලිවිය යුතු ය.

**ලකුණු බෙදී යන පිළිවෙළ (මුළු ලකුණු 15න් නම්)**

I. අන්තර්ගත කරුණු - ලකුණු 08 යි
II. අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ - ලකුණු 04 යි
III. ශිල්පීය දක්ෂතා (පද බෙදීම හා විරාම ලක්ෂණ ආදිය) ලකුණු 03 යි (ඡේද බෙදා ඇත්නම් ලකුණක් අඩු කළ යුතු ය.)
IV. වචන ප්‍රමාණය අඩු හෝ වැඩි නම් ලකුණු 03ක් අඩු වේ.
V. ලේඛන ව්‍යවහාරයෙන් ලියා තිබිය යුතු ය.

❖ **පහත දැක්වෙන ඡේදවල වචන සංඛ්‍යාවෙන් 1/3 ක් වන සේ සාරාංශ කොට ලියන්න.**

1. වහින්නට තතනන අහසෙහි වූ තාරකා, දුම් පැල්ලම් සහිත නිල් රෙදි කඩකින් වැසුණු විදුලි පහනක් සේ බබළයි. මඳ සුළඟකුදු නොහමන නමුත් මිදුලෙහිත් ආලින්දයෙන් වාතය තෙතමනයෙන් හා සිසිල් ගුණයෙන් යුක්ත විය. පිළිකන්න අසල වූ ජම්බු ගසක ඉදුණු ගෙඩි කෑමට පැමිණි වවුලකු අත්තටු ගසන හඬ හාන්සි පුටුවක දිගාවී හුන් වෙද රාලට ඇසුණි. අහස වහින්නට තතනන නිසාදෝ වත්තෙහි කුරුමිණි සතුන් නඟන වීණා, හොරණෑ, කයිතාලම්, හඬ වෙනදා මෙන් නොඇසේ.

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

2. ඉන්දියන් සාගරයේ මුතු ඇටය යන විරුදාවලිය ලත් ශ්‍රී ලංකාවේ දේශගුණය තේ, රබර්, පොල් වැනි වාණිජ බෝග සඳහා වඩාත් යෝග්‍ය යැයි පිළිගෙන ඇත. ප්‍රමාණවත් වර්ෂාපතනයක් හා කුඹුරු වලට හරවා ගතහැකි ගංගා හා වැවු ජලය නිසා අපේ රටේ කුඹුරු ගොවිතැන් ද සරුවට කෙරේ. උස් බිම්වල මෙන් ම ඇතැම් පහත් බිම්වල ද තේ පැළය සරුවට වැවෙතත් වැඩි ඉල්ලුමක් ඇත්තේ උස් බිම්වල වැවෙන තේවලට ය. භූමියේ උස් ප්‍රමාණය අනුව තේ වල රසය ද උසස් වීම ඊට හේතුයි. ලංකාවේ පහත් බිම්වලින් වැඩි හරියක් පොල් ගසේ සෙවණ ලබයි. වන රොදෙන් හා තේ පඳුරුවලින් අලංකෘත උස් බිම්වලින් සමන්විත ශ්‍රී ලංකාව රමණීය දිවයිනකි.

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

3. අප දියලුමට පැමිණියේ සුළඟින් ගුම් ගත් මුහුද මෙන් ගුම් නඟමින් මහත් වේගයෙන් ගිලිහී ගල් පෙරලා ගෙන ගුගුරමින් බැස දිවෙන ප්‍රචණ්ඩ ජල ප්‍රවාහය දැකීමේ අටියෙනි. නියං කාලයේ දී දියලුම එවැනි ජල ප්‍රවාහයක් නොවේ. කෙළින් අඩි 628 අහසට නැංගා වූ මහා පර්වතයක මුදුනින් දෙරියනකට වඩා පුළුල් නොවූ ක්ෂීර ධාරාවක් සේ ගලා බස්නා දියලුම දිය ඇල්ල තෙත් සිත් පිනවන එකම සෞන්දර්ය ප්‍රවාහයකි. පර්වතයේ එක් වී අතුරුදහන් වන වාෂ්ප සහිත පෙණ කැටි නගමින් බසින දිය දහර දුර සිට බලන්නෙකුට ක්ෂීර ප්‍රවාහයක් සේ පෙනෙන නමුත් ළංව බලන කල එහි රමණීයත්වය විවිධ වෙයි. කඩතොලු වල හැපීමෙන් විසිරී ගොස් වාතයට එක් වී අතුරුදහන් වන වාෂ්ප සහිත පෙණ කැටි නගිමින් බසින දිය දහර දුර සිට බලන්නෙකුට ක්ෂීර ප්‍රවාහයක් සේ පෙනෙන නමුත් ළංව බලන කල එහි රමණීයත්වය විවිධ වේ.

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

4. මෙරට ප්‍රධානම වැවිලි කර්මාන්ත කිහිපයක් මේ වන විට පවතින්නේ පිපිරීමට ආසන්න ගිනි කන්දක් මත යැයි පැවසුව හොත් එය බොහෝ දුරට නිවැරදි ය. එම තත්වයට වැඩි වශයෙන් මුහුණ දී ඇත්තේ තේ කර්මාන්තය සහ රබර් කර්මාන්තයයි. එසේම කුරුඳු ආදී සුළු අපනයන බෝග කර්මාන්තය ද සැලකිය යුතු අර්බුදයකට බලපා ඇති ප්‍රධානතම හේතුව වී තිබෙන්නේ ලෝක ආර්ථිකයේ හට ගෙන ඇති කැළඹිලි සහගත තත්වයයි. මෙය මඟ හරවා ගැනීමට වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉදිරි ගමනට ප්‍රධාන රැකුලකි. එමඟින් මේ රටේ ආර්ථිකය වඩාත් සුරක්ෂිත කරගත හැකි වනු ඇත. ලෝක ආර්ථිකය පහළ වැටෙන විට ශ්‍රී ලංකා ආර්ථිකය ද පහළ වැටෙන නමුත් තේ සහ රබර් කර්මාන්ත නව දුරටත් කාර්යක්ෂම කළහොත් ඒ මඟින් දියුණු රටවල තේ හා රබර් පිළිබඳ ඒකාධිකාරය හිමි කරගත හැකි වේ.

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

5. කඩදාසි භාවිතය යුරෝපීයයන්ගෙන් ඇබ්බැහිවන්ට පෙර, ලක්දිව පොත්පත් ලියනු පිණිස ගැනුණ තල් පත්හි අකුරු ලියන ලද්දේ, පන්හිඳ තුඩිනි. කෙළින් ඉරි ගැසීමෙහිදී, කෙඳි සහිත තල් පත ඉරෙයි. තල් පත් භාවිතයට ගැනීම නිසා, මේ අවධියෙහිදී, එවැනි ඉරි ගැසීමට සිතාමතා වෑයම් කරන ලදැයි සිතමි. ලිවීමට තල්පත් ගත් ඉන්දියාවේ සහ ආසන්න අනෙකුත් හැම රටවල ද වටකුරු අකුරු රූප විකාසනය වීය. පොදුවේ තල්පත් භාවිතයට නොගත් උතුරු ඉන්දියාවේ අක්ෂරයන් විකසිත වූයේ අනෙක් මඟකිනි. මේ අනුමානය පිළිගනිත හොත්, සිංහල හෝඩියෙහි අකුරු වටකුරු රූපයෙන් යුක්ත වීමට පෙර, ලීවීමට කවුරුනුත් ගත්තේ, තල් කොළ හැර අනෙක් කිසිවයයි තීරණය කළ යුතු ය. පොත් කම්බයකට උණ පතුරු ගන්නා ලද හයි මහාවංශ ටීකාකාරයන් කියන බැවින්, උණ පතුරු ලිවීමට ද ගන්නා ලදැයි හැඟේ. ලී පත් යන අර්ථ ඇති, සිංහල කැටපත්, ශබ්දය කාෂ්ඨපත්‍ර යන සංස්කෘත සමාස ශබ්දයෙන් ආවකි. මෙ වැනි වචන භාවිතය, ලී පතුරෙහි තෙලි කුරින් අකුරු ලියූ වකවානුවක් මතක් කරවයි. භාරතිය සභ්‍යත්වය පිළිගත් මධ්‍ය ඉන්දියාවේ ජනයා අතර ඒ ලිපි ක්‍රමය පැවැත්තේ ය.

..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

**6. පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සදහන් කරන්න.**

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උපුටා නොදැක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කරුණක් නම් අධ්‍යාපනය සමාජ වෙනස්වීම් සඳහා සාධකයක් ලෙස බලපවත්නා ආකාරයයි. සංවර්ධනයේ දී පාරම්පරික සමාජ ව්‍යුහයේ පරිණාමයක් අවශ්‍ය වෙයි. තවද ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවත් ද නව්‍යකරණයට බාධක වන සිරිත් විරිත් සහ ඇගැයීම් බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්වීම් ඇති කිරීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද අලුත් උසස් සමාජ පන්ති පෝෂණය කරලීමෙන් ද මුළු සමාජය පුරාම නායකත්වය පිළිබඳ විවිධ රටාවන්හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදනයේ සංවර්ධනය හා සම්බන්ධ සමාජ සහ දේශපාලන සාධක දන්නා තරමට ම සමාජ වෙනස්වීම් ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ ඇති වැදගත්කම ගැන ද දැන ගත යුත්තේය. අධ්‍යාපන ශුභසාධන

අංගයක් වශයෙන් නොව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම් එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත් කර ගත යුතුය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින්ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනුව හැඩ ගස්වා ගත යුතු බවයි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනයේ උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂතම ඇතියවුන් නියම වශයෙන් ලබාදීම ඉන් පළමු වැන්න වේ. නවීන කාර්මික ඥානය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන් ම නවීන වුත් විද්‍යාත්මක වුත් හැඟීමක් ඇතිකර ගැනීමත් සමඟ ම සංවර්ධන අරමුණු හා ගැළපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙවැනි අවශ්‍යතාව ඉතා ම වැදගත් වෙයි. කුමක් හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදන ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා සාමාන්‍යයෙන් ජනතාව ලබා ගන්නා කාර්මික දැනීම් ප්‍රමාණය මූලික වන හෙයිනි.

**7. පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශකොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.**

පාඨක ජනයාත් විචාරකයාත් එක් අවස්ථාවක ඉතා ඉහළින් අගය කළ කෘතිය තව වරෙක නොතකා හැරීමේ අවස්ථා සාහිත්‍ය ලෝකයේ හිඟ නොවේ. එක් අවධියක එක් සාහිත්‍යාංගයක් ප්‍රිය වන අතර තවත් අවස්ථාවක අනෙක් සාහිත්‍යාගයක් ජනප්‍රිය වනු ඇත. මෙවැනි ධර්මතා සහ ඒවාට පසුබිම් වූ හේතු සාධකාදිය විභාග කිරීමත් මෙම අධ්‍යනයට අයත් වෙයි. ඇතැම් ලේඛකයන්ගේ කෘති සාධු සම්මතවූයේත් ශ්‍රේෂ්ඨ නිර්මාණ ලෙස පිළිගැනුණේත් ඒ කර්තෘන් මිය පරලොව ගියාට ද පසුව බව අපි දනිමු. අනෙක් අතින් ඇතැම් කෘති එහි කර්තෘවරයා ජීවත් ව සිටියදී හෝ ඔහුත් සමඟ ම අභාවයට යනු පෙනේ, තවත් කෘතියක් එදත් අදත් හෙටත් ප්‍රශංසාවට ම පාත්‍ර වන්නේය. ඇතැම් කෘතියක් ශ්‍රේෂ්ඨ නිර්මාණයක් සේ මුලින් පිළිගැනෙනුයේ එම කෘතිය බිහි වූ දේශය තුළ නොව අනෙක් රටක විය හැකි ය. මේ සියල්ල සිදුවන්නේ හේතු රහිතව නොවේ. මෙවැනි කරුණු විභාග කිරීම සමාජය සාහිත්‍ය අධ්‍යනයට පැවරෙන වගකීමක් වෙයි. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් ව සිටීමේ දායාදයක් වශයෙන් ඉංග්‍රීසි සාහිත්‍ය කෘති මෙරට පාඨකයා අත පැතිරුණ අතර එක් අවධියක ප්‍රංශ හා රුසියානු සාහිත්‍යයක් ජනප්‍රිය වීමට හේතු තිබිය යුතුය. පිහිටීම අතිනුත් ඓතිහාසික හා සංස්කෘති සම්බන්ධතා අතිනුත් වඩාත් සමීප රට වන ඉන්දියාවේ චිරන්තන සාහිත්‍යයෙන් විචාර වාදත් මෙහි නොඅඩුව ප්‍රචලිත වූ නමුත් වර්තමාන සාහිත්‍යය සම්බන්ධයෙන් එසේ නොවීමට හේතු කවරේ ද? සිංහල පාඨකයා අන් හැම සාහිත්‍යකට ම වඩා අඩුවෙන් දන්නේ අපේ ම සහෝදර ජනතාව වන දෙමළ ජනයාගේ සාහිත්‍යය නොවේද?

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

**8. පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න,**

සාහිත්‍ය කෘතිවල කාලීන සමාජාර්ථයක් මූලභූත වන නිසාත්, සාහිත්‍ය කෘතිවල රචනා උපක්‍රම සමාජ ලක්ෂණවලට අනුරූපව සකස්වන නිසාත්, සාහිත්‍ය නිර්මාණයක අගය හා වැදගත්කම එය සම්පාදිත වූ යුගයට හා සමාජයට සීමා නොවන්නේ දැයි කෙනෙකුට මෙහිදී ප්‍රශ්නයක් මතු කළ හැකි ය. එහෙත් කවර උසස් සාහිත්‍ය කෘතියක වුව ද ද්විත්ව ලක්ෂණ විද්‍යාමාන වේ. එක් අතකින් එම රචනය ලියවුණු යුගයට හා සමාජයට විශේෂ වූ ලක්ෂණ එහි දක්නට ලැබේ. අනික් අතින් දේශයේත් කාලයේත් සීමා වලින් විනිර්මුක්ත වුත් සාර්වත්‍රික වුත් සර්වකාලීන වුත් ලක්ෂණ එහි දක්නට ලැබේ. ඇත්ත වශයෙන් ම කවර සාහිත්‍ය නිර්මාණයක වුව ද වැදගත්කම රඳා පවතින්නේ එම විශ්ව සාධාරණ ලක්ෂණ මතයි. ඒ වූ කලී සාහිත්‍ය කෘතියක ධ්වනිතාර්ථයයි. සාහිත්‍ය කෘතියෙන් නැගෙන පොදු ධ්වනියයි. බොහෝ විට එය මනුෂ්‍ය ස්වභාවය සහ ජීවිතය සම්බන්ධ සනාථන අර්ථයකින් හෙබි විග්‍රහයක් වන්නේය. සාහිත්‍ය කෘතීන්හි මේ විශ්ව ව්‍යාප්ති ස්වභාවය විද්‍යමාන නොවේ නම් කාලය විසින් මෙන්ම දේශය විසින් ද අපට දුරස්ථ වූ ගේ පියර් කිවිඳුන්ගේ දෘශ්‍ය කාව්‍ය හෝ රුසියන් නවකතාකරුවන්ගේ නිර්මාණයන් කුමට කියවාමුද? අපට ඒවායින් රසයක් හා අරුතක් උකහා ගැනීමට පිළිවන් වන්නේ කෙසේ ද?

කවර භාෂාවෙන් රචිත වුව ද කවර දේශයකට අයත් වුවද, උසස් සාහිත්‍ය නිර්මාණය මිනිසා සතු පොදු වස්තුවක් බවට පත් වන්නේ මේ ධ්වනිතාර්ථය නිසාය. එහෙත් එම ධ්වනිතාර්ථය උලුප්පා දැක්වීමට කාලීන දේශීය ලක්ෂණ අත්‍යස්ථයෙන් වැදගත් වේ. ඒ ඒ සමාජ වල පවත්නා සිරිත් විරිත් පුද පූජා ඇදහිලි විශ්වාස ආදිය සාහිත්‍ය කෘතියකට ජීවමාන විලාශයක් අරුත් කරවීමටත් පාඨකයාගේ විශ්වාසය දිනා ගැනීමටත් බෙහෙවින් අවශ්‍ය වේ.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

**9. පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.**

සුවදායි ජීවිතයක් අපේක්ෂාවෙන් ස්වභාව ධර්මය අභිභවනයකොට මනුෂ්‍ය සංහතිය විසින් නිර්මාණය කර ගන්නා ලද තාක්ෂණය මිනිසා විසින් මිනිසාට ම එරෙහිව යෙදවීම විසිවන සියවසයේ වඩාත් තහවුරු විය. න්‍යෂ්ටික අවි නිෂ්පාදනය සහ අධිරාජ්‍යවාදී ප්‍රචණ්ඩ යුද්ධ සැලසුම් ද මෙකල අන් සියල්ල අභිබවා ප්‍රමුඛත්වයට පැමිණ ඇත. සමස්ත මානව පැවැත්ම ම ඛේදවාචකයක් බවට පමුණුවාලන මේ තත්ත්වය කලාවේ විෂය ක්ෂේත්‍රය පෘථුලත්වයට පත් කිරීමට හේතු වී තිබේ. අප්‍රිකානු, ඉන්දියානු, වියට් නාමය හා පලස්තීන සාහිත්‍ය කෘති මේ සඳහා මනා නිදසුන් සපයයි. මෙහි ප්‍රතිපක්ෂය ගතහොත් මානුෂීය පැවැත්මෙහි ද, එහි ප්‍රතිඵලය වශයෙන් එහි සාහිත්‍යයේ හා කලාවේ ද විනාශය සිදු කිරීමට ක්‍රියාත්මක වනු ඇත්තේ ද මේ වෛෂයික පදනම මය. මානව සංහතිය පෘථිවි තලයෙන් අතුගා දමා දේශදේශාන්තරයන් තමතමන් අතර බෙදා හදා ගැනීමට ලොව මහ බලවතුන් සැලසුම් කරන යුද්ධෝපායන්ගේ න්‍යෂ්ටිය ලෙස තාක්ෂණයම ක්‍රියාත්මක වෙයි. තාක්ෂණය මානව සංහතියේ හා කලාවේ වර්ධනය සඳහා ඉටු කර ඇති එමෙන් ම ඉටු කරන්නා වූ මෙහෙවර අනුපමේය ය. එහෙත් තාක්ෂණය නො සැලසුම්කරණයකින් යුක්තකොට ලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ උරුමයන් බවට පත් කරන තෙක් එය විලංගු ලා සිර අඩස්සි කළ ලෙසකින් පවතියි. මනුෂ්‍ය ඝාතක ද, ඒ සඳහා ඇති දුෂ්ට සැලසුම් ද සුණු විසුණු කොට මහජනයාට තාක්ෂණයේ විපුල ඵල නෙලා ගත හැකි වන්නේත්, තාක්ෂණය බැඳ දමා ඇති යදම් ලිහා බහුජන අයිතියට පවරා මානව ප්‍රගතිය ඒකායන අරමුණ කොට ගත් විද්‍යාත්මක සැලසුම්කරණයකට භාජනය කිරීමෙන් ම පමණි.

**10.** **පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශකොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.**

අධ්‍යාපනයට ගරු කරන එක ම දේශපාලන සහ සමාජ පිළිවෙත නම් ප්‍රජාතන්ත්‍රවාදයයි පවසා ඇත. පුරවැසියන්ගේ යුක්තිගරුක සහ සුපරිචිත සිත් සතන් ප්‍රජාතන්ත්‍ර වාදයේ පදනම වන බැවින් නූගත් ජනතාවක් අතරේ පහළ වන පුජාතන්ත්‍ර වාදයක් ගැන සිතීමට පවා නොහැකි ය. වැඩෙන පරම්පරාවේ සිතුම් පැතුම් නිවැරදි මං ඔස්සේ යොමු කිරීම සඳහා විශේෂයෙන් සැකසුණු අධ්‍යාපන ක්‍රමයක් සංවර්ධනය කිරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී රටක් සිය ආරක්ෂාව සලසා ගැනීම වැදගති. ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපන ප්‍රතිපදාවේ ප්‍රධාන කාර්යය වනුයේ ශිෂ්‍යයා සමාජයට පා තබන අවධියේ දී එහි සංකීර්ණ භාවය අවබෝධ කර ගැනීමට උපකාර වන පරිදි එය සරල ව ද, නිශ්චිතවද, ඔහුට ඉදිරිපත් කිරීම ය. ප්‍රජාතන්ත්‍රවාදී රටවල සෑම පෙරමුණකින් ම තර්ජන එල්ල වන ලෝකයක ජීවත් වන අප දරුවනට ප්‍රජාතනත්‍රවාදය ක්‍රියාත්මක වන පිළිවෙළ පමණක් අවබෝධ කර දීම ප්‍රමාණවත් නො වේ. ඊට ඇලුම් කිරීමටත් ඒ ගැන උදම් වීමටත් බැලූ බැල්මට දක්නට ලැබෙන එහි ව්‍යාකූලත්වය තුළින් පෙනෙන උත්කෘෂ්ට ආදර්ශ සහ හරය වටහා ගැනීමටත් අපගේ ගැටලු ලුහුඬින් නිරාකරණය කළත් ඉතා හානිකර, ප්‍රජාතන්ත්‍ර විරෝධී කෙටි මාර්ග අනුගමනය කිරීමෙන් වැළකී සිටීමටත් ඔවුනට ඉගැන්විය යුතු ය. ප්‍රජාතන්ත්‍රවාදී රටක අධ්‍යාපනය ආරම්භයේ පටන් අවසානය දක්වා ම සජීව ක්‍රියාකාරී අත්දැකීම විය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**12.** **පහත සඳහන් පාඨය වචන 70 ක් පමණ වන සේ ඔබේ වචන වලින් සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක්ද යොදන්න. සාරාංශයේ අග ඔබ යෙදූ වචන ගණන සඳහන් කරන්න.**

නිලධාරින් විසින් විෂය මාලාවේ ඇති කරන ලද සුළු සංශෝධන අධ්‍යාපනික ව ඉතා උසස් වූ නමුත් මහජන ඉල්ලීම අනුව පසුව ඇති කරන ලද විශාල සංයෝධන හා සසඳා බලන විට එසරම් සැලකිය යුතු නො විය. ජාතික උන්නතියට අනුකූල ව දේශීය සංගීතය, නැටුම්, චිත්‍ර සහ ශිල්ප, මේ රටේ ඉතිහාසය හා භූගෝල විද්‍යාව ඉගැන්වීම කෙරෙහි වැඩි අවධානයක් යොමු විය. තම දරුවකට ඉංග්‍රීසි ඉගැන්විය යුතු සිවට මහජන ඉල්ලීම් වැඩිවත් ම රට හැම තැන ම කුඩා නගරවල පවා වැඩි වැඩියෙන් ඉංගිරිසි පාසල් ඇති විය. විෂය මාලාව අතින් බලන විට මෙසේ ඇති වූ නොදියුණු ඉංගිරිසි පාසල් වඩාත් ළං වූයේ සංවිධිත පැරණි ඉංගිරිසි පාසල් වලට නොව ස්වභාෂා පාසල් වලට ය. මේ පාසල් ල්වල විද්‍යාව හා පැරණි සම්භාව්‍ය භාෂා ඉගැන්විණි. ඒවායේ සිෂ්‍යයෝ විශ්ව විද්‍යාලයට ඇතුළු වීමට හෝ උසස් රැසියා ලබා ගැනීමට හෝ බලාපොරොත්තු නොවූ අතර තරමක ඉංගිරිසි දැනීමක් අවශ්‍ය වූ ලිපිකාර සහ වෙනත් මධ්‍යම පන්ති රැසියාවක් ලැබීමෙන් තෘප්තියට පත් වූහ. රජයේ මධ්‍ය විද්‍යාල ආරම්භ කිරීම, වැඩි වැඩියෙන් ඉංගිරිසි පාසල් අවශ්‍ය යැයි මහජන උයෝෂණයේ ප්‍රතිඵලයකි. කෙසේ වෙතත් මේ පාසල් ආරම්භ කිරීමෙන් ශාස්ත්‍රීය ඉංගිරිසි අධ්‍යාපනයක් පමණක් නොව ගම්හිද සිසුනට ප්‍රායෝගික අධ්‍යාපනයක් ද දීමට පුළුවන් වෙතියි රජය අදහස් කළේ ය. ඒ කෙරෙහි මහත් පරිශ්‍රමයක් දැරුව ද මෙයින් දෙවැනි බලාපොරොත්තුව ඉෂ්ට නොවී ය. දිවයිනේ නගර කීපයක ම පිහිටුවා ඇති, සහසුකම් සහිත රජයේ මේ මධ්‍ය විද්‍යාල නොයෙක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවේ යෙදවීම සඳහා උපයෝගි කර ගන්නා ලදී.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................